අබේවර්ධන වයි. ඒ. එන්. වයි.

පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*Poster*

# ශ්‍රී ලංකාවේ ආයුර්වේද සර්පවිෂ වෛද්‍යවරුන් සතු දේශීය ඥාන පද්ධතිය පිළිබඳ අධ්‍යයනයක්

ආයුර්වේද සර්ප විෂ වෛද්‍යවරුන් අතර පවතින දේශීය ඥාන මූලාශ්‍ර හඳුනා ගැනීමත්, එකී මූලාශ්‍ර සතුව පවතින දේශීය දැනුම හඳුනාගැනීම සහ එක්රැස් කිරීමත්, අවිධිමත්ව පවතින මෙම විෂයට අදාළ දේශීය දැනුම විධිමත් ආකාරයට වාර්තා කිරීම සහ මතු පරපුර උදෙසා සංරක්ෂණය කර තැබීමත් මෙම පර්යේෂණයේ මූලික අරමුණු විය. එසේම වර්තමානය වන විට ආයුර්වේද සර්පවිෂ වෛද්‍යවරුන් සතු දේශීය දැනුම කෙතරම් දුරට ප්‍රායෝගිකව භාවිතයට ගන්නේ ද යන්න සොයා බැලීමත්, මේ හා සම්බන්ධ දේශීය දැනුමේ අනාගත පැවැත්ම සහ සංවර්ධනය කෙරෙහි එල්ල වී ඇති තර්ජන හඳුනා ගැනීම සහ සංරක්ෂණ යෝජනා ඉදිරිපත් කිරීමත් මෙම පර්යේෂණයේ සෙසු අරමුණු ලෙස සඳහන් කළ හැක.

ශ්‍රී ලංකාව පුරා ආයුර්වේද සර්පවිෂ වෛද්‍යවරුන් විසිරී සිටියද මෙම අධ්‍යයනයේදී නියැදිය එක් දිස්ත්‍රික්කයකට පමණක් සීමාකර, එහි ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරක් පමණක් මෙම අධ්‍යයනය සඳහා අදාළ කරගෙන තිබේ. ඒ අනුව ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පේ, අත්තනගල්ල, බියගම සහ මහර යන කොට්ඨාශ මේ සඳහා අදාළ කරගෙන ඇත. එසේම දත්ත එක්රැස් කිරීමේදී මෙම කොට්ඨාශවල සිටින වෛද්‍යවරුන් අතරින් දේශීය දැනුම සුරැකිව පවතින බවට හඳුනාගන්නා ලද මූලාශ්‍රවලින් සහ පැරණිම වෛද්‍යවරුන්ගෙන් තොරතුරු ලබාගෙන තිබේ.

පර්යේෂණයේදී දත්ත රැස්කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදය වශයෙන් ව්‍යුහගත ප්‍රශ්න පදනම් කරගත් සම්මුඛ සාකච්ඡා ක්‍රමයත් එයට අමතරව නිරීක්ෂණ සහ අවශ්‍යතාවය මත ලබාගන්නා ද්විතික මූලාශ්‍රන් භාවිත කර ඇත.

ඒ අනුව දැනුමේ පැවැත්මට උචිත ක්‍රමවේදයක්, භාවිතයක් මෙන්ම දැනුමේ සංවර්ධනයක් නොමැති වීම, අවශ්‍ය ඖෂධ හිඟය, කාර්යබහුලත්වය, වත්මන් පරපුර එම දැනුම ඉදිරියට රැගෙන ඒමට මැලිවීම, වැනි තත්ත්වයන් හේතු කොට ගෙන ආයුර්වේද සර්පවිෂ වෛද්‍ය ක්‍රමය සමග සබැඳි දේශීය දැනුම් පද්ධතිය අභාවයට යමින් පවතින බව නිගමනය කළ හැකි විය.

මේ සඳහා රාජ්‍ය අනුග්‍රහය යටතේ ආයුර්වේද සර්පවිෂ වෛද්‍යවරුන් සතුව පවතින දේශීය දැනුම් මූලාශ්‍ර හඳුනාගැනීම සඳහා නිශ්චිත වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමත්, අවශ්‍ය දුර්ලභ ඖෂධ වැනි දෑ මහා පරිමාණයෙන් වගා කිරීමට කටයුතු කිරීමත්, මෙම දැනුම් පද්ධති විද්‍යාත්මක පර්යේෂණයන්ට ලක් කර, විද්‍යාත්මකව තහවුරු කරගෙන නවීන වෛද්‍ය විද්‍යාව සමග සංකලනය කරමින් වඩාත් ඵලදායී තත්ත්වයක් ඇතිකිරීමට අවශ්‍ය පියවර ගැනීමත්, මෙහි ප්‍රධාන යෝජනා වශයෙන් දැක්විය හැක. එයට අමතරව මෙම සාම්ප්‍රදායික වෛද්‍යවරුන් ලියාපදිංචිකිරීම වැනි වැඩසටහනක් හරහා ඔවුන්ට නිසි වැදගත්කමක් ලබාදීමත්, මෙම දැනුම් පද්ධතියේ වැදගත්කම පිළිබඳව මහජනතාව දැනුවත් කර ඒ සඳහා පොදුවේ අවශ්‍යවන අනුග්‍රහය සහ ප්‍රචාරය සඳහා විධිමත් වැඩපිළිවෙලක් දියත් කිරීමත් මෙහි සෙසු යෝජනා වශයෙන් ඉදිරිපත්කළ හැක.

**මූලික පද : දේශීය දැනුම, ආයුර්වේදය, සර්පවිෂ වෛද්‍ය ක්‍රමය, ශ්‍රී ලංකාව, මානව විද්‍යාව**